# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 40 දරන
# ගොවිජන සේවා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 සැප්තැම්බර් මස 08 වැනි දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1993 සැප්තැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.**

මිල : ශත 30 යි.     තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 40 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 සැප්තැම්බර් මස 08 වන දින]

එල්. ඩී.—ඕ. 46/92

## 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 40 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 27 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1979 අංක 58 දරන පනතේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1990 අංක 9 දරන ගොවිජන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) යම් නියමිත බැංකුවක් විසින් ප්‍රදානය කරන ලද යම් ණය මුදලක නොගෙවා ඉතිරිව ඇති සම්පූර්ණ කොටස සහ ඒ ණය මුදල මත අයවිය යුතු පොලිය සම්බන්ධයෙන් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියකු හෝ බුක්තිකරුවකු විසින් මේ කොටසේ විධිවිධාන යටතේ පැහැර හැරීමක් කර ඇති හෝ කර ඇතැයි සලකනු ලබන අවස්ථාවක, ඒ බැංකුව විසින්, දැන්වීමක් මගින් ඒ ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති බව මහේස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දිය හැකි ය.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.